ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020.07.13 |

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයේ තැන්පත්කරුවන් වෙත රක්ෂණ වන්දි ගෙවීම

***ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයේ*** තැන්පත්කරුවන් වෙත රුපියල් ලක්ෂ 6ක උපරිමයකට යටත්ව රක්ෂණ වන්දි ගෙවීම 2020 ජූනි මස 07 වන දින ආරම්භ කරන ලද අතර දිවයින පුරා මහජන බැංකු ශාඛා 63ක් මගින් මේ වන විට ගෙවීම් සිදු කෙරේ.

***ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනය*** මගින් තහවුරු කරන ලද තැන්පත්කරුවන් 147,000කට පමණ රක්ෂණ වන්දි ගෙවීම සඳහා අවශ්‍ය මුදල් ***තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල*** වෙතින් මේ වන විටත් වෙන් කර දී අවසන් ය. 2020.07.12 දින වන විට, ***ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයේ*** තැන්පත්කරුවන් 19,279ක් මහජන බැංකුව වෙත පැමිණ තමන්ට හිමි රක්ෂණ වන්දි මුදල් ලබා ගෙන ඇති අතර ඒ වෙනුවෙන් මේ දක්වා වැය වී ඇති මුදල රුපියල් 5,175,336,249.68ක් (රුපියල් කෝටි 517ක් පමණ) වේ.

සැලකිය යුතු තැන්පත්කරුවන් ප්‍රමාණයක් තවමත් තමන්ට හිමි රක්ෂණ වන්දි මුදල් ලබා ගැනීම සඳහා පැමිණ නොමැති බැවින් මහජන බැංකුව වෙත පැමිණ තමන්ට හිමි රක්ෂණ වන්දි මුදල් ලබා ගන්නා ලෙස ***ද ෆිනෑන්ස් කොම්පැනි පී.එල්.සී. ආයතනයේ*** මුදල් තැන්පත් කර තිබූ, ඉහත සඳහන් පරිදි ආයතනය විසින් තහවුරු කරන ලද සියලු ම පුද්ගලයන්ට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ පිළිබඳව වැඩි විස්තර සඳහා අමතන්න.

**මහජන බැංකුව :** 0112-481594, 0112-481320, 0112-481617, 0112-481703

**ශ්‍රී ලංකා මහ බැංකුව :** 0112-398788, 0112-477261